# NATIONAL ACCOUNTING (Part-IV)

*S. Madushanka*

*B.Sc (Mgt) Accounting (Special) (U.G)*

*University of of Sri Jayewardenepura*

## නිෂ්පාදන ඉම

නිෂ්පාදන ඉම (Production boundary) සංකල්පය භාවිත කරනුයේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන් කර අර්ථ දැක්වීමට යි.

SNA – 2008 ජාතික ගිණුම්කරණ ක්‍රමවේදයට අනුව නිෂ්පාදන ඉම ඉතා පැහැදිලි ව විස්තර කරයි.

## නිෂ්පාදකයන් වර්ග

නිෂ්පාදන ඉම අර්ථකථනය සඳහා පවත්නා ආර්ථිකය තුළ ඔවුන් ඉටු කරන ප්‍රධාන තිමැවුම අනුව නිෂ්පාදකයන් වර්ග තුනකි.

- වෙළෙඳපොළ අරමුණු කොටගත් නිෂ්පාදකයන් (Market Producer)

- වෙළෙඳපොළ අරමුණු කොට නොගත් වෙනත් නිෂ්පාදකයන් (NPISHS)

- ගෘහ ආර්ථික ඒකක කටයුතු අයත් නිෂ්පාදකයන්

ClassWork.LK

# ජාතික ගිණුම්කරණයේ දී නිෂ්පාදන ඉම තුළට ඇතුළත් කළ යුතු නිෂ්පාදන ක්‍රියාකාරකම්

- වෙළෙඳපොළේ විකිණෙන සියලුම භාණ්ඩ හා සේවාවන් නිෂ්පාදන ඉමට ඇතුළත් වේ.

- නිෂ්පාදනය කළ ආයතනය හැර සෙසු ආයතනික ඒකක සඳහා නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවා

- තමන්ගේ ම අවසාන පරිභෝජනය සඳහා හෝ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කොට ඒවායේ නිෂ්පාදකයන් විසින් තමන් වෙත රඳවා ගන්නා ලද සියලුම භාණ්ඩ

- තමන් සතු ව ඇති තමන් පදිංචි වී සිටින නිවාසවලින් ලබා දෙන නේවාසික සේවය

- වැටුප් ලබන සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවා සහ පෞද්ගලික සේවා

ClassWork.LK

- තමන්ගේ ම පරිභෝජනය සඳහා කෘෂි භෝග නිෂ්පාදනය, ඒවා ගබඩා කොට තබා ගැනීම, වනාන්තරවලින් ආහාර භෝග ලබා ගැනීම හා පලතුරු රැස් කර ගැනීම, දර කැපීම සහ එකතු කිරීම, දඩයම් කිරීම සහ මසුන් අල්ලා ගැනීම

- කෘෂි නිෂ්පාදන සැකසීම, වී කොටා සහල් සකසා ගැනීම, පිටි කොටා ගැනීම, මස් මාළු කල් තබා ගැනීම සඳහා පිළියෙළ කිරීම, පලතුරු බෝතල් කිරීම හා වියලා ගැනීම, කිරි මුදවා ගැනීම, කූඩ සහ පන් මලු විවීම, පැදුරු වීවීම ආදිය

- රෙදි විවීම, ඇඳුම් මසා ගැනීම, ගොතන ලද ඇඳුම් සහ තොප්පි, ගෘහ භාණ්ඩ තනා ගැනීම

- ජලය සපයා ගැනීම (කුඩා ඇළවල්, දිය ඇලි මගින්, ජලය සපයා ගැනීම සඳහා කුඩා ව්‍යාපෘති සැකසීම)

ClassWork.LK

# ගෘහ ඒකකය තුළ ඉටු කරනු ලබන සේවා

මෙලෙස ගෘහ ඒකකය තුළ සිදුවන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාකාරකම් නිෂ්පාදන ඉමට ඇතුළත් කළ ද ගෘහ ඒකකයේ සාමාජිකයන් විසින් තමන්ගේ ම පෞද්ගලික පරිභෝජනය සඳහා ඉටු කරනු ලබන සේවා ආර්ථික නිෂ්පාදන ක්‍රියාවන් ලෙස නොසැලකයි.

**නිදසුන් :-**

- නිවසේ සාමාජිකයන්ට ආහාර පිසීම
- දරුවන් රැකබලා ගැනීම
- නිවසේ වියපත් හා ආබාධිතයන් රැකබලා ගැනීම
- නිවෙස් අලංකරණ හා පිරිසිදු කිරීම් ආදිය

ClassWork.LK

# මිනිසාගේ මැදිහත් වීමක් සහිත ද නැද්ද යන්න මත නිෂ්පාදන ඉමට ඇතුළත් කිරීම හෝ නොකිරීම

මිනිසාගේ මැදිහත් වීමක් සහිත ද නැද්ද යන්න මත නිෂ්පාදන ඉමට ඇතුළත් කිරීම හෝ නොකිරීම සිදුවේ.

**නිදසුන් :-**

විවෘත ජලාශයක මත්ස්‍ය ගහනය ජනනය වීම නිෂ්පාදන ඉමට ඇතුළත් නොවේ.

ස්වාභාවික සම්පතක් වුව ද පුද්ගලයෙකුගේ පාලනයට නතුවී නිෂ්පාදනයක් බිහි වන්නේ නම් ඒවා නිෂ්පාදන ඉමට අයත් වේ.

**නිදසුන් :-**

මත්ස්‍ය උද්‍යානයක ඇති කරන මසුන්ගේ බෝ වීම

ClassWork.LK

# නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතු

දළ දේශීය නිමැවුම ගණනය කිරීමේ දී නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතු ද ඇතුළත් විය යුතු ය.

# නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතුවල කොටස්

- සැඟැවුණු ආර්ථික කටයුතු
- නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු

ClassWork.LK

# සැඟැවුණු ආර්ථික ක්‍රියාකාරකම්

සැඟැවුණු ආර්ථික ක්‍රියාකාරකම් ලෙස සලකනු ලබන්නේ විධිමත් ගණනය කිරීමකට පාත්‍ර නොවන නීත්‍යනුකූල ආර්ථික ක්‍රියාකාරකම් ය.

## සැඟැවුණු ආර්ථික ක්‍රියාකාරකම් වසන් කොට තබා ගැනීමට උත්සාහ දැරීමට බලපාන හේතු

- බදු ගෙවීමෙන් වැළකී සිටීම
- සමාජ ආරක්ෂණ දායක මුදල් ගෙවීමෙන් වැලකී සිටීම
- නීතිමය ප්‍රමිතීන් පිළිපැදීමෙන් වැළකී සිටීම

**නිදසුන් :-**

අවම වැටුප් ගෙවීම, උපරිම වැඩ කාලය පිළිබඳ නීති

මෙලෙස වාර්තා නොතැබීම, තොරතුරු සැපයීම හා නීතිරීති මඟ හැරීම නිසා සැඟවුණු ආර්ථික කටයුතු පිළිබඳ ව දත්ත නොලැබී යාම මෙහි දී දැකිය හැකි ය.

ClassWork.LK

# නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු

## නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතුවල ස්වරූප

- නිතියෙන් තහනම් කොට ඇති භාණ්ඩ හා සේවා නිපදවීම සහ බෙදා හැරීම.

  **නිදසුන් :-**

  මත්පැන්, මත්ද්‍රව්‍ය, ගණිකා සේවය, තහනම් භාණ්ඩ ප්‍රවාහනය

- ඇතැම් නීත්‍යනුකූල භාණ්ඩ හා සේවා නීත්‍යනුකූල ව ලියාපදිංචිය නොලත් පුද්ගලයන් විසින් නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම.

  **නිදසුන් :-**

  ලියාපදිංචිය නොලත් වෛද්‍ය සේවය

ClassWork.LK

# දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායී කටයුතු

- ගෙවීමකින් තොර ව නිවස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවය (නොගෙවූ ගෘහ සේවා)
- නොමිලේ ලැබෙන ස්වාභාවික සම්පත් ( භූමිය, ජලය, වාතය ආදිය)
- මිනිස් ශ්‍රමයකින් තොර ව වර්ධනය වන ස්වාභාවික සම්පත් (වනාන්තර ආදිය)
- ඉගෙනීම හා විවේකය
- මිල වෙනස් වීම හෝ ස්වාභාවික වර්ධනය හෝ මගින් සම්පත් වල සිදුවන වටිනාකම වෙනස් වීම

ClassWork.LK

## දේශීය නිමැවුම ගණනය කිරීමේ දී බැහැර කෙරෙන ඵලදායී ඵලදායී නොවන වෙළෙඳපොළ ගනුදෙනු

- සංක්‍රාම
- මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු
- පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු

ClassWork.LK

# ශ්‍රී ලංකාවේ දළ දේශීය නිමැවුම ගණනය කිරීමේ දී භාවිත කරන විවිධ ආකෘති

- කර්මාන්ත මූලය අනුව වර්ගීකරණය
- ආයතනික අංශ අනුව වර්ගීකරණය

ClassWork.LK

# කර්මාන්ත මූලය අනුව වර්ගීකරණය

## ශ්‍රී ලංකාවේ සම්මත, කර්මාන්ත කටයුතුවලට මූලික වශයෙන් ඇතුළත් වන ශීර්ෂයන්

- කෘෂි කර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය
- පතල් කැණීම්, නිෂ්පාදන කර්මාන්ත විදුලිය හා ජලය නිෂ්පාදන කටයුතු
- උප අංශය නිෂ්පාදන කර්මාන්ත
- ඉදිකිරීම්
- වෙළෙඳාම ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම
- තොරතුරු හා සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා
- මූල්‍ය හා රක්ෂණ සේවා
- නිවාස අයිතිය හා දේපොළ වෙළෙඳාම

ClassWork.LK

- වෘත්තීය විද්‍යාත්මක තාක්ෂණික පරිපාලන හා සහාය සේවා
- රාජ්‍ය පරිපාලනය, ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ සේවා
- වෙනත් සේවා

- ඉහත ශීර්ෂ දහයට අදාළ ආර්ථික ක්‍රියාකාරකම්වල මූල්‍යමය වටිනාකම මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය වේ.

ClassWork.LK

# ආයතනික අංශ අනුව වර්ගීකරණය

## ආයතනික අංශය

ආයතනික අංශයක් ( ඒකකයක් ) යනු සමස්ත ආර්ථිකය තුළ වත්කම් හිමිකර ගැනීම, වගකීම් දැරීම සෙසු ආයතනත් සමඟ ගනුදෙනුවලට සම්බන්ධවීමට හැකියාව ඇති ආර්ථික ඒකක ය.

## සමස්ත ආර්ථිකය

සමස්ත ආර්ථිකය යනු ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ සියලු ම ආයතනික ඒකක නේවාසිකව කටයුතු කරන ආර්ථික ප්‍රදේශයක් ලෙස හඳුන්වයි.

## ආර්ථික ප්‍රදේශය

ආර්ථික ප්‍රදේශය යනු සඵල ආර්ථික පාලනයක් සහිත තනි ආණ්ඩුවක් යටතේ පුද්ගලයන්ට, භාණ්ඩවලට හා ප්‍රාග්ධනයට නිදහසේ සංචලනය විය හැකි භූගෝලීය ප්‍රදේශයකි.

ClassWork.LK

# සමස්ත ආර්ථික ප්‍රදේශය තුළ සිටින ප්‍රධාන ආයතනික ඒකක

## මූල්‍ය නොවන සමාගමික අංශය NFC

මේ යටතට ගැනෙන්නේ වෙළෙඳපොළ අරමුණු කරගත් නිෂ්පාදනයන්හි නිරත වන විවිධ සංස්ථා හා සමාගම් ය. මේ යටතට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේ ම නිෂ්පාදන සමාගම් අයත් ය.

## මූල්‍ය සමාගමික අංශය FC

මූල්‍ය සේවා සැපයීම ප්‍රධාන අරමුණ කරගත් සංස්ථා හා සමාගම් මේ යටතට ගැනේ. මූල්‍ය අතරමැදි කටයුතු හා වෙනත් විශේෂිත භාණ්ඩ හා සේවා සැපයීම මෙම අංශයේ කාර්යභාරය වේ. මේ යටතට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේ ම සමාගම් අයත් ය.

ClassWork.LK

## රාජ්‍ය අංශය GG

රාජ්‍ය අංශයට වෙළෙඳපොළ අරමුණු කර නොගත් පෞද්ගලික හා සාමූහික පරිභෝජනය සඳහා සේවා සපයන විවිධ රාජ්‍ය ආයතන මෙයට
අයත් වේ.

**නිදසුන්**

අධ්‍යාපනය, සෞඛ්‍ය, ආරක්ෂාව, පරිසරය සුරැකීම

## ලාභ අපේක්ෂාවෙන් තොර ව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය NPISH

නොමිලේ හෝ වෙළෙඳපොළ මිලට වඩා අඩුවෙන් හෝ ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන වේ. මෙම ආයතනයන්හි සේවකයින් හෝ සාමාජිකයින් ස්වේච්ඡා වෙන් තම ශ්‍රමය කැප කරයි.

**නිදසුන්**

පුණ්‍ය ආයතන, ආගමික සංවිධාන, දේශපාලන පක්ෂ

ClassWork.LK

## ගෘහ ඒකක HH (කුටුම්බ අංශය)

තමන්ගේ ම පරිභෝජනය සඳහා සහ වෙළෙඳපොළ අරමුණු කොට ගෙන නිෂ්පාදන කටයුතුවල නිරත වන ගෘහ ඒකක මෙම අංශයට අයත් වේ. පාරිභෝගික හා නිෂ්පාදක දෙපිරිස ම මෙම ගෘහ අංශය තුළ සිටිති. ආගමික පූජ්‍ය පක්ෂය හා සිර ගත පිරිස් ද මීට අයත් ය.

- ඉහත ආයතනික ඒකක පහට අදාළ ආර්ථික ක්‍රියාකාරකම්වල මූල්‍යමය වටිනාකම මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය වේ.

## අවශේෂ ලෝකය

ඉහත නේවාසික ආයතනික ඒකක පහට අමතර ව නේවාසික නොවන කුටුම්බ හා සමාගමික අංශය ලෙස තවත් ආයතනික ඒකකයක් පවතී.

එය අවශේෂ ලෝකය ලෙස හඳුන්වයි.

ClassWork.LK

# නිෂ්පාදන ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම් තක්සේරු කිරීම සඳහා පවතින විවිධ මිල ගණන්

- මූලික මිල
- නිෂ්පාදකයන්ගේ මිල
- ගැනුම්කරුවන්ගේ මිල

ClassWork.LK

# <u>මූලික මිල</u>

මූලික මිල යනු නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සූදානම් කොට ඇති අවස්ථාවක දී එම භාණ්ඩය හෝ සේවාව සඳහා අදාළ මිල වේ.

එනම් ගැනුම්කරුවන්ගෙන් නිෂ්පාදකයාට ලැබිය යුතු මිල මූලික මිල වශයෙන් හඳුන්වයි. නිෂ්පාදකයා නිෂ්පාදනයේ දී ලබාගත් සහනාධාර මෙම මිලට ඇතුළත් වී ඇත.

**නිදසුන් :-**

පොහොර සහනාධාරය

ප්‍රවාහන වියදම් මූලික මිලට ඇතුළත් නොවන අතර ගැනුම්කරුවන් විසින් නිෂ්පාදකයාට ගෙවූ වෙන් කළ නොහැකි ප්‍රවාහන වියදම් මෙම මිලට ඇතුළත් වී තිබිමට ඉඩ ඇත.

නිෂ්පාදිතය මත අය කරනු ලබන කිසි දු බද්දක් මූලික මිලට ඇතුළත් නොවේ.

ClassWork.LK

# මූලික මිල ගණනය කළ හැකි ආකාරය

| |
|---|
| මූලික මිල = නිෂ්පාදකයන්ගේ මිල - නිෂ්පාදිතය මත පනවන ශුද්ධ බදු |

( නිෂ්පාදිතය මත ශුද්ධ බදු = බදු - සහනාධාර )

ClassWork.LK

# නිෂ්පාදිතය මත අය කරනු ලබන බදු හා නිෂ්පාදනය මත අයකරනු ලබන වෙනත් බදු

නිෂ්පාදිතය මත අය කරනු ලබන බදු හා නිෂ්පාදනය මත අයකරනු ලබන වෙනත් බදු අතර වෙනසක් පවතී.

## නිෂ්පාදිතය මත අය කරනු ලබන බදු

නිෂ්පාදිතය මත අය කරනු ලබන බදු නිෂ්පාදිත ඒකක මත රඳා පවතින අතර එය ඒකක හෝ ප්‍රතිශතක හෝ බද්දක් විය හැකි ය.

ClassWork LK

# <u>නිෂ්පාදනය මත අය කරනු ලබන වෙනත් බදු</u>

නිෂ්පාදනය මත අය කරනු ලබන වෙනත් බදු, අය කරනු ලබන්නේ නිපදවනු ලබන භාණ්ඩය හෝ නිෂ්පාදකයාගේ ලාභය හෝ මත නොව නිෂ්පාදනයට අදාළ භූමිය, ස්ථාවර වත්කම්, සේවක සංඛ්‍යාව හෝ වෙනත් ආදළ ක්‍රියාකාරකම් යන ගනුදෙනු මතය.

**නිදසුන් :-**

- සේවක වැටුප් ප්‍රමාණයෙන් කිසියම් ප්‍රතිශතයක් භූමිය, ගොඩනැගිලි මත අය කරන බදු
- ව්‍යාපාරික හා වෘත්තීමය බලපත්‍ර ගාස්තු
- මුද්දර බදු
- වාහන සඳහා අයකරන බදු
- පරිසර දූෂණ ( විමෝචන ) බදු
- විදේශ සංචාර හා ප්‍රේෂණ මත අයකරන බදු

ClassWork.LK

# නිෂ්පාදිතය මත ලබාදෙන සහනාධාර හා නිෂ්පාදනය මත ලබාදෙන වෙනත් සහනාධාර

## නිෂ්පාදිතය මත ලබාදෙන සහනාධාර

නිෂ්පාදිතය මත ලබාදෙන සහනාධාර යනු නිෂ්පාදනය කරන භාණ්ඩය සඳහා ලබාදෙන සහනාධාර වේ. ඒවා ඒකක සහනාධාර හා ප්‍රතිශතක සහනාධාර වලින් යුක්ත වේ.

**නිදසුන් :-**

තේ. පොල්, රබර් වැනි බෝග සඳහා ලබා දෙන මූල්‍ය සහනාධාර

ClassWork.LK

## නිෂ්පාදනය මත ලබා දෙන වෙනත් සහනාධාර

නිෂ්පාදනය මත ලබා දෙන වෙනත් සහනාධාර යනුවෙන් අදහස් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ලබා දෙන සහනාධාර වේ.

**නිදසුන් :-**

- ආයතනයේ සේවක සංඛ්‍යාව මත ලබා දෙන සහනාධාර
- රැකියා ප්‍රවර්ධනය දිරිමත් කිරීම සඳහා ලබා දෙන සහනාධාර
- ශාරිරික දුබලතාවන්ගෙන් පෙළෙන පුද්ගලයන් සේවා නියුක්ත කිරීම දිරිමත් කිරීමට දෙන සහනාධාර
- පුහුණු කිරිමේ වැඩ සටහන් දිරිමත් කිරීමට දෙන සහනාධාර
- පරිසර දූෂණය අවම කිරීමට දෙන සහානධාර
- ප්‍රතිචක්‍රීයකරණය සඳහා ලබා දෙන සහනාධාර

ClassWork.LK

## නිෂ්පාදකයන්ගේ මිල

නිෂ්පාදකයන්ගේ මිල ලෙස හැඳින්වෙන්නේ නිෂ්පාදන ස්ථානයෙන් වෙළෙඳුන් කරා භාණ්ඩය ඉවතට යන විට නිෂ්පාදකයා විසින් අය කරනු ලබන මිල ය.

එනම් මූලික මිලට නිෂ්පාදකයා වෙත සෘජුවම පැවරූ නිෂ්පාදිත බදු එකතු කොට නිෂ්පාදකයාට ලබා දුන් සහනාධාර අඩු කිරීමෙන් පසු ලැබෙන අගයයි.

## නිෂ්පාදකයාගේ මිල ගණනය කළ හැකි ආකාරය

නිෂ්පාදකයාගේ මිල = මූලික මිල +නිෂ්පාදිතය මත බදු - නිෂ්පාදිතය මත සහනාධාර

ClassWork.LK

# ගැනුම්කරුවන්ගේ මිල

ගැනුම්කරුවන්ගේ මිල හෙවත් ගැනුම් මිල යනු පාරිභෝගිකයා සත්‍ය වශයෙන්ම භාණ්ඩ හා සේවා සඳහා ගෙවන මිල වේ.

නිෂ්පාදකයන්ගේ මිලට අතිරේකව ප්‍රවාහන ගාස්තු වෙළෙඳ ආන්තිකයන් සහ ගැනුම්කරුවන් විසින් ගෙවිය යුතු ශුද්ධ බදු ඇතුළත් කොට ගැනුම්කරුවන්ගේ මිල සැකසෙයි.

## ගැනුම්කරුවන්ගේ මිල ගණනය කළ හැකි ආකාරය

ගැනුම්කරුවන්ගේ මිල **=** නිෂ්පාදකයන්ගේ මිල **+** අතරමැදියන් විසින් අය කරනු ලබන වෙළෙඳ තීරුව සහ ප්‍රවාහන අය කිරීම් **+** (පාරිභෝගිකයන්ගෙන් අය කරන භාණ්ඩ මත බදු - රජය විසින් පාරිභෝගිකයන් වෙනුවෙන් වෙළෙන්දාට ලබාදෙන සහනාධාර)

ClassWork.LK

# වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය

දළ දේශීය නිෂ්පාදිතය හැම විට ම වෙළෙඳපළ මිලට ඇස්තමේන්තු කළ යුතු බැවින් දළ එකතු කළ අගයන් සමූහයට ශුද්ධ වක්‍ර බදු ගැළපූ විට වෙළෙඳපොළ මිල යටතේ දළදේශීය නිෂ්පාදිතයේ වටිනාකම ලැබේ.

GDP = .GVA + NT

GVA = දළ එකතු කළ අගයන් සමූහය

NT = ශුද්ධ වක්‍ර බදු


- නව ක්‍රමවේදයට අනුව ජාතික ගිණුම් සැකසීමේ දී දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනුයේ වෙළෙඳපොළ මිල යටතේ පමණි.

ClassWork.LK

# කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය

රටෙහි කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය පෙන්වන ප්‍රධාන දර්ශකය කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයයි. අන්තර්ජාතික ප්‍රමිතියට අනුව මෙය ප්‍රධාන ක්‍රියාකාරකම් 17ක් ආවරණය කරයි.

## කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතියට නිදසුන්




**ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015 ඇසුරෙන්**

ClassWork.LK

දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම පවත්නා මිලට රටක නිෂ්පාදිතයේ වටිනාකම කාලයත් සමඟ වෙනස් වී ඇත් ද නැති ද යන්න දැන ගැනීම ජාතික ගිණුම්වල එක් වැදගත් අරමුණකි.

## වර්තන මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය

අදාළ කාලය තුළ නිෂ්පාදිත භාණ්ඩ හා සේවා තොගයෙහි වටිනාකම එම වර්ෂයේ පවත්නා මිලෙන් තක්සේරු කිරීමෙන් වර්තන මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ අගය ලැබේ.

## ස්ථාවර මිල මත දළ දේශීය නිෂ්පාදිතය

අදාළ කාලය තුළ නිෂ්පාදිත භාණ්ඩ හා සේවා තොගයෙහි වටිනාකම කිසියම් පාදක වර්ෂයක මිලෙන් තක්සේරු කිරීම මගින් ලබාගන්නා අගය ස්ථාවර මිල මත දළ දේශීය නිෂ්පාදිතය ලෙස සැලකේ.

ClassWork.LK

# දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය යනු පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම සහ ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතික සම්බන්ධය යි.

$$\text{දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය} = \frac{\text{පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය}}{\text{ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය}} \times 100$$

ClassWork.LK

## සංකල්පමය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය

සංකල්පමය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය යනුවෙන් අදහස් කරනුයේ රටක ආර්ථික ප්‍රදේශය ඇතුළත කිසියම් කාල පරිච්ඡේදයක් තුළ (සාමාන්‍යයෙන් වර්ෂයක් තුළ) නිෂ්පාදනය කරන ලද සියලු ම අවසාන භාණ්ඩවල හා සේවාවල වටිනාකමයි.

## දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී ප්‍රායෝගික ක්‍රමවේදය

දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී ප්‍රායෝගික ක්‍රමවේදය වනුයේ කිසියම් රටක ආර්ථික ප්‍රදේශය තුළ වර්ෂයක් ඇතුළත සිදු වන සියලු ම ආර්ථික ක්‍රියාකාරකම්වල එකතු කළ අගය ගණනය කිරීම යි.

ClassWork.LK

දළ දේශීය නිෂ්පාදිතය සමන්විත වන්නේ මෙම දළ එකතු කළ අගයයන් සමූහයේ එකතුව යි.

**නිදසුන් :-**

| | | |
|---|---|---|
| දළ නිමැවුම *(GVO)* | | 200 |
| අමු ද්‍රව්‍ය | 80 | |
| සේවා පිරිවැය | +40 | |
| අතරමැදි පරිභෝජනය *(IC)* | | -120 |
| දළ එකතු කළ අගය *(GVA)* | | 80 |

දළ දේශීය නිෂ්පාදිතය හැම විට ම වෙළෙඳපොළ මිලට ඇස්තමේන්තු කළ යුතු බැවින් ඉහත එකතු කරන ලද දළ එකතු කළ අගයන් සමූහයට ශුද්ධ බදු ගැළපිය යුතු ය.

දළ දේශීය නිෂ්පාදිතය = දළ එකතු කළ අගය - ශුද්ධ බදු

$$GDP = GVA + \text{ශුද්ධ බදු}$$

(ශුද්ධ බදු = භාණ්ඩ මත බදු - සහනාධාර)

ClassWork.LK

## ශුද්ධ දේශීය නිෂ්පාදිතය

දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමින් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩු කළ විට ලැබෙන අගය ශුද්ධ දේශීය නිෂ්පාදිතය යි.

$$NDP = GDP - CTC$$

## ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය

රටක සාමාන්‍යයෙන් වර්ෂයක් තුළ නිෂ්පාදනය කරන ලද සියලු ම අවසාන භාණ්ඩවල හා සේවාවල වටිනාකමෙන් එක් පුද්ගලයකුට ලැබෙන වටිනාකම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයයි.

## ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන ආකාරය

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය = මධ්‍ය වාර්ෂික ජනගහනය

ClassWork.LK

# දළ ජාතික ආදායම

කිසියම් රටක යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ (සාමාන්‍යයෙන් වර්ෂයක් තුළ) නිෂ්පාදනය ක්‍රියාවලිය නිසා ජනනය කෙරෙන ප්‍රාථමික ආදායම් සියල්ලෙහි එකතුව වන දළ දේශීය නිෂ්පාදිතයට අවශේෂ ලෝකයේ නේවාසිකයන් විසින් උපයනු ලබන ප්‍රාථමික ආදායම හෙවත් ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් එකතු කළ විට ලැබෙන අගය දළ ජාතික ආදායම යි.

දළ ජාතික නිෂ්පාදිතය යන සංකල්පය වර්තමානයේ භාවිතා නොකෙරේ. එයට හේතුව දළ දේශීය නිෂ්පාදිතයට ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් ගැළපූ විට ලැබෙන්නේ නිෂ්පාදිත අගයක් නොව ආදායම් අගයක් වීම යි.

දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම

(ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම = වෙනත් රටවලින් ලැබූ ප්‍රාථමික ආදායම් - වෙනත් රටවලට ගෙවූ ප්‍රාථමික ආදායම්)

ClassWork.LK

# <u>ශුද්ධ ජාතික ආදායම</u>

ශුද්ධ ජාතික ආදායම යනුවෙන් හඳුන්වන්නේ දළ ජාතික ආදායමෙන් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩු කළ විට ලැබෙන අගය යි.

ශුද්ධ ජාතික ආදායම **=** දළ ජාතික ආදායම - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය

(ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය **=** ප්‍රාග්ධන ක්ෂය වීම්)

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura